# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP)

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවාගැනීම

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යනු ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය US$ මිලියන 150ක් වන අතර 2024-2028 කාල සීමාව සඳහා ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක හරහා ප්‍රාථමික සෞඛ්‍ය සත්කාරක සේවාවන් වෙත ප්‍රවේශය හා තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා එය සැලසුම් නිර්මාණය කොට ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) පහත සඳහන් තනතුරු (01 හා 02) සඳහා වන ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. එක් එක් තනතුර සඳහා වන වැටුප් 2019 මාර්තු 05 දනම අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ මත පදනම් වේ.

| තනතුර | තනතුරු ප්‍රමාණය | කාණ්ඩය (චක්‍රලේඛ අංක 01/2019 පරිදි) | සුදුසුකම් |
|---|---|---|---|
| 01. අධීක්ෂණ හා ඇගයීම් විශේෂඥ | 01 | PS 4 | සුදුසුකම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2019 පරිදි වේ. ඇමුණුම 1 (පිටු 1-26) හි US$ මිලියන 100 හෝ සමාන හා US$ මිලියන 250 ට අඩු තීරුව බලන්න |
| 02. ජ්‍යෙෂ්ඨ පරිසර හා සමාජ ආරක්ෂක නිලධාරි | 01 | PS 5 | |

ඉහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද හා වගකීම්, නිපුණතා හා ප්‍රවීණතාවයන්, ප්‍රධාන කාර්යභාර හා පොදු කොන්දේසි සඳහා කරුණාකර මෙම වෙබ් අඩවියට පිවිසෙන්න : **www.rb.gy/mew323**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2025 මැයි 19 වෙනි දින

විස්තරාත්මක ජීව දත්ත සහිත අයදුම්පත් (නියමිත ආකෘතියක් නොමැත) අධ්‍යාපන, පළපුරුද්ද හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් අමුණා සම්බන්ධ කර ගත හැකි දුරකථන/ ෆැක්ස්/ ඊමේල් ලිපිනය සහිතව **"......................... ...... තනතුර සඳහා අයදුම්පත - ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP)"** යන ශීර්ෂය සඳහන් කර 2025 මැයි 19 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් (පමණක්) පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP),**
**191ඒ, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, "ද බංගලෝ",**
**ධර්මපාල මාවත, කොළඹ 07.**
**ඊමේල් : info@phsep.lk**

අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද, නිපුණතා හා ප්‍රවීණතා නොසපුරාලන, ප්‍රමාද, අසම්පූර්ණ, ආධාරක ලිපිලේඛන ඇතුළත් නොකළ, ලියාපදිංචි තැපැල් මගින් හැර වෙනත් මාර්ගයකින් (ඊමේල්, අතින් ගෙනවිත් භාරදීම හෝ වෙනත් ලිපිනයක් සඳහන්) අයදුම්පත් සලකා නොබලන අතර, ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP).**